**වනසත්ව සංරක්ෂණ අරමුදල - 2014**

**------------------------------------------**

වනසත්ව සංරක්ෂණ අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ 55 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂපත්‍රයේ , ආදායම් වියදම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය ව්‍යාචනය**

**------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**--------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව වත්කම පරිහරණයට සුදුසු තත්ත්වයට පත්වූ දින සිට එම වත්කම ක්ෂය කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම නිසා වර්ෂයේ ක්ෂය වීම රු. 10,136,160 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 අනුව තොග අගය කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව කිරිපිටි සඳහා ගෙවිය යුතු රු.4,004,160 ක් ද, විදුලිය සඳහා ගෙවිය යුතු රු. 126,658 ක් ද, පුවත්පත් දැන්වීම් සඳහා ගෙවිය යුතු රු. 61,880 ක් ද උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රබර් උණ්ඩ 7,500 ක් මිලදී ගැනීම සඳහා රු. 4,178,965 ක මුදලක් යුධ හමුදාවට ගෙවා තිබුණ නමුත් තොග ලැබී නොතිබුණු බැවින් මාර්ගස්ථ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා වියදමක් ලෙස ලියා හැර තිබුණි.

(ඇ) නාය ගහ කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය නිසා වනජීවී රක්ෂිත තුළට සිදුවූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා පුද්ගලික සමාගමකින් ලැබී තිබුණු රු.3,000,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

(අ) පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| i. අලිවෙඩි තොග | 761,712 | භෞතික තොග සත්‍යාපන වාර්තා |
| ii. දැනුවත් කිරීමේ වැඩසටහන් | 800,000 | සහභාගී වූවන්ගේ නාම ලේඛනය සහ සම්පත් දායකයන්ගේ විස්තර |
| iii. ගෙවිය යුතු ප්‍රසාද දීමනා | 33,197,326 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |

(ආ) අරමුදල වෙනුවෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කරනු ලබන ගනුදෙනු අරමුදලේ ලෙජරයට පිටපත් කිරීම ජ'නල් සටහන් මගින් සිදුකර තිබුණි. එසේ වුවත්, අදාල ජ'නල් සටහන් ජ'නලයක පමණක් සටහන් කර තිබුණද, ජ'නල වවුචර් සකස් කර නොතිබුණු අතර ජ'නල සටහන් සඳහා පදනම් වූ උපයෝගී ලියවිලි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ජ'නල සටහන් මගින් අරමුදලේ ගිණුම්වලට මාරු කර තිබුණු රු.2,158,036,329 ක ගනුදෙනු පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වසර 03 කට වඩා පැරණි ගෙවිය යුතු සේවා ගාස්තු ශේෂය රු.60,063,971 ක් විය.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතියකින් තොරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 3,377,500 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) මහා භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව රු. 7,945,400 ක් වටිනා බවුසර් ටේලර් 15 ක් සහ ටිපින් ටේලර් 12 ක් මිලට ගෙන තිබුණි.

## 2.5 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 (i) | පිරිවැය රු. 6,265,797 ක් වූ ලී බඩු හා උපකරණ මරදමඩු වන නිවහනේ බඩුවට්ටෝරු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| i. 5.4.4 (i) වගන්තිය | අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් නොමැතිව රු.337,650 ක අත්තිකාරම් ගෙවා තිබුණි. |
| ii. 8.13.4 වගන්තිය | ලුණු වැව සංචාරක බංගලාව ඉදිකිරීමේදී අතිරේක වැඩ හා පිරිවැය විචලනයෙහි එකතුව මුළු පිරිවැය වටිනාකමින් සියයට 10 ක් ඉක්මවා ගෙවීම සම්බන්ධව අමාත්‍යාංශය ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 735,934,278 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 530,377,190 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.205,557,088 ක වැඩිවීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී උද්‍යාන පිවිසුම් ගාස්තු ආදායම් රු.240,316,894 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ඉකුත් වර්ෂයේ ආදායම වූ රු. මිලියන 942.4 ක සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 1199.6 දක්වා රු.මිලියන 257.2 කින් හෙවත් සියයට 27.3 කින් වැඩිවී තිබුණි.

(ආ) අරමුදලේ ඉකුත් වර්ෂයේ වියදම රු.මිලියන 412 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු. මිලියන 463.68 ක දක්වා රු.මිලියන 51.68 කින් හෙවත් සියයට 12.5 කින් වැඩිවී තිබුණි. එම වැඩිවීම කෙරෙහි විදේශීය පුහුණු හා එකතු කළ අගය මත බදු වෙනුවෙන් දැරූ වියදම් සියයට සියයකින් ද විවිධ වියදම් සියයට 623 කින් ද වනජීවීන් සංරක්ෂණයට අදාළ වියදම් සියයට 517 කින් හා අලි පලවා හැරීමේ වියදම් සියයට 113 කින්ද වැඩිවීම හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මරදමඩු වන නිවහන සංචාරකයින් 60 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් ලබා දීම සඳහා ඉදිකර තිබූ අතර එම සංචාරක නිවාසය සඳහා එක් බංගලා භාරකරුවෙකු සහ බංගලා සහකාරවරයෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. ප්‍රමාණවත් නිලධාරීන් නොයොදවා තිබීම නිසා එම නිවස නියමිත පරිදි නඩත්තු කළ නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සංචාරකයින්ගේ පැමිණීමේ ලේඛනය අනුව මරදමඩු වන නිවහන 2014 ජූලි 11 දින සිට දේශීය සංචාරකයින් හට විවෘත කර තිබුණි. තවද මෙම සංචාරකයින්ගේ පැමිණීමේ පිටවීමේ ලේඛනයේ බලපත්‍ර හිමියාගේ නම පමණක් ඇතුළත් කර තිබූ අතර සංචාරකයින්ගේ පැමිණීමේ වේලාව හා පිටවූ වේලාව සටහන්කර නොතිබුණි. ඒ අනුව නිවැරදිව හා විධිමත් ලෙස මෙම ලේඛන නඩත්තු කර නොතිබුණි.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

සමාලෝචිත වර්ෂයේ ලිත් 100,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු. 358,000 ක මුදලක් අරමුදලේ අරමුණු වලින් බැහැරව වියදම් කර තිබුණි.

### 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.12,873,293 ක් වැයකර ඉදිකර තිබුණු මහවැව සංචාරක බංගලාව වෙත යාමට නිශ්චිත මාර්ගයක් සකස් නොකිරීම නිසා ඉදිකිරීම් අවසන් වී තිබුණ ද 2015 පෙබරවාරි දින වන විට වර්ෂයකට වැඩි කාලයක් භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) එකතුව රු. 11,727,309 ක් වැයකර ඉදිකර තිබුණු වීවල සංචාරක නිවාසය ජලය නොමැති වීම නිසා භාවිතයට ගත නොහැකිව 2015 ජූලි වන විට අවුරුදු 01 මාස 09 ක කාලයක් වසා දමා තිබුණි.

### 4.4 හඳුනාගන්නා ලද පාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ මරදමඩු වන නිවහන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු. 15,668,338 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දැයට කිරුළ ප්‍රදර්ශන භූමිය තුළ සවිකිරීම සඳහා විශාල ප්‍රමාණයේ LED රූපවාහිනි තිරයක් කුලී පදනම මත ලබා ගැනීමේදී අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයට ලබා නොදීම නිසා රු. 891,935 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලුණුවැව සංචාරක බංගලාව ඉදිකිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා රු. 1,201,847 ක් වැය කර තිබුණි. තවද මිහින්තලේ මහකනදරාව සංචාරක බංගලා භාරකරු නිල නිවස ඉදිකිරීම් මිනුම් භෞතික පරීක්ෂාවේදී රු. 748,760 ක අතිරික්ත ගෙවීමක් සිදුකර තිබුණි. එකී මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලුණුවැව, මහකනදරාව, මහවැව සහ වීවල සංචාරක බංගලා ඉදිකිරීමේ ප්‍රමාදයන් සම්බන්ධව අයකළ යුතුව තිබුණු රු. 4,157,820 ක් වූ ප්‍රමාද ගාස්තුවලින් අයකර තිබුණේ රු. 66,664 ක් පමණි.

(ඇ) ඉහත සංචාරක බංගලාවන් හතරෙහිම විශේෂ පන්තියේ (VIP) කාමර ඉදිකිරීම සඳහා අතිරේක හා අමතර වැඩ වෙනුවෙන් රු. 26,777,087 ක මුදලක් වැය කර තිබුණි. තවද වර්ෂා අවස්ථාවලදී සංචාරක බංගලා ඇතුළත වැසි ජලය (හුළං සමඟ) පතිත වීම, වැසි ජලය බැස යාමට කාණු පද්ධති ඉදිකර නොමැති වීම, වැහි පීලි යොදා නොතිබීම වැනි සැලසුම් කිරීමේ අඩුපාඩු නිරීක්ෂණය විය.

(ඈ) මාණික්කපොල උත්තු සංචාරක බංගලාව ඉදිකිරීමේ රු. 13,524,826 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුවකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ගිවිසුම අනුව මෙම ඉදිකිරීම අවසන් කළයුතු දිනය 2013 මැයි 10 වුවත් 2015 පෙබරවාරි අවසානය දක්වා වැඩ නිමකර නොතිබුණි. ඉදිකර තිබුණු ජල ටැංකියට PVC 100 mm බට යෙදීමට එකඟ වී තිබූ නමුත් ඒ වෙනුවට ප්‍රමිතියෙන් බැහැරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර තිබුණු PVC බට යොදා ඒ සඳහා රු.106,500 කට බිල්පතක් ඉදිරිපත් කර තිබුණි. මෙම ඉදිකිරීමේ උපදේශක සේවාව සැපයීමට මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය රු.786,000 ක මුදලකට එකඟ වී තිබුණ අතර රු. 652,256 ක මුදලක් 2015 අප්‍රේල් වන විට ගෙවා තිබුණි.

සංචාරක නිවාසයේ ඇතුළත වැට, ගිනිසපු ලීයෙන් සෑදීම හා පොලිෂ් කිරීම සඳහා රු. 383,670 ක මුදලක් මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයේ සහතිකය මත ගෙවා තිබුණි. නමුත් මෙම වැට ප්‍රමිතියෙන් තොර වීම නිසා, සංචාරක නිවාසය විවෘත කිරීමටත් පෙර දිරා යාමට පටන්ගෙන තිබුණි. කෙසේවුවද මෙම සේවාවේ සැලසුමේ අඩුපාඩු හා නිසි සැලකිල්ල නොමැති වීම නිසා ඉදිකිරීමේ ප්‍රමාදයන් සිදු වී තිබූ බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඉ) විල්පත්තු ජාතික වනෝද්‍යානයේ මරදමඩු වන නිවහන ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කර තිබුණු ගිවිසුමට අනුව 2013 ජුනි 12 දින නිම කළ යුතු වුවද ගිවිසුම් ප්‍රකාරව නිමකර නොතිබුණු අතර ඊට අනුකූලව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. උපදේශක ආයතනයේ නිසි සැලසුම් නොකිරීම, විගණනයට තොරතුරු ලබා නොදීම, භෞතික ප්‍රගති වාර්තා නොමැති වීම, අවසාන බිල්පත ඉදිරිපත් නොකර අතිරේක වැඩ බිල්පත් 02 ක් මඟින් ගෙවීම් කටයුතු සිදු කිරීමට නිර්දේශ ලබා දීම, තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ඉදිරිපත්කර තිබූ ටෙන්ඩර්පත්‍ර සහ උපයෝගී ලියවිලිවල අඩුපාඩු යනාදී දුර්වලතා මෙකී කොන්ත්‍රාත්තුව

සම්බන්ධව නිරීක්ෂණය විය. පෙන්වාදෙන ලද මෙම දුර්වලතා නිවැරදි කිරීමට හෝ මේ සම්බන්ධව අදහස් දැක්වීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

### 5.1 ක්‍රියාකාරි සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් නොවූ රු.22,335,666 ක ගොඩනැගිලි ඉදිකිරීම් හා රු. 4,178,966 ක රබර් උණ්ඩ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

### 5.3 විගණන කමිටු රැස්වීම

-------------------------

ජාතික උද්‍යානවල සංචාරකයින් සඳහා පරිගණක ගත ප්‍රවේශපත් නිකුත් කිරීම කළ නොහැකි අවස්ථාවලදී පොදු 172 යොදාගැනීම මගින් සිදුවිය හැකි විෂමාචාර වළක්වා ගැනීම සඳහා ප්‍රවේශපත් හඳුන්වාදීමට කටයුතු කිරීම සඳහා ගෙන තිබුණු තීරණයට වසර දෙකක් ගතවී තිබුණද මේ දක්වා තීරණය කළ පරිදි ටිකට් පත්‍ර නිකුත් කිරීම සිදුකර නොතිබුණි.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

ඉකුත් වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දෙනු ලැබූ පහත සඳහන් විගණන නිරීක්ෂණ සම්බන්ධව අරමුදල / දෙපාර්තමේන්තුව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(අ) 2008 වර්ෂයේ සිට ගිනි අවි, පතොරම් හා අලි වෙඩි පිළිබඳ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබීම හා පෙර සිටි නිලධාරීන් තමා භාරයේ පැවති වත්කම් ලිඛිතව භාරදීමක් ද සිදුකර නොතිබීම.

(ආ) උඩවලව ඇත් අතුරු සෙවණේ රු. 58,000 ක් වටිනා ටිකට් පොත් 16 ක් අස්ථානගත වීම.

(ඇ) පොදු 172 කුවිතාන්සිය භාවිතයෙන් වන උද්‍යානවල ආදායම් එකතු කිරීමේදී වංචා සිදුකළ හැකි බව නිරීක්ෂණය වූ අතර මෙම අහිතකර තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව විගණන කමිටු රැස්වීමේදී එකඟ වී වසර දෙකක කාලයක් ගත වුවද එය නිවැරදි කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබීම.

(ඈ) අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ අලි ගාල් කිරීම හා අලි ගොඩ බෑමේ වේදිකාව ඉදිකිරීම වෙනුවෙන් රු. 4,574,919 ක් වැය කර තිබුණද ගොඩනැගිලි නිෂ්ක්‍රීයව පැවතීම.

(ඉ) මන්නාරම කාර්යමණ්ඩල නිල නිවාස, වන අඩවි ආරක්ෂක කාර්යාලය හා කම්කරු නිල නිවස ඉදිකිරීම සඳහා රු. 8,630,360 ක වටිනාකමකට 2011 වර්ෂයේ දී ගිවිසුම් අත්සන් කර 2011 වර්ෂය අවසානයට පෙර වැඩ නිම කිරීමේ එකඟතාවය මත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 1,933,200 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භකර නොතිබුණි.

**5.5 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

2009 අංක 22 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත සකස් කිරීමේ ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ වනසතුන් හා වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමි ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා ද, එම වනසතුන් හා වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමි වානිජ ලෙස සහ වෙනත් ආකාරයට අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම වැලැක්වීම සඳහා ද, ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම විය යුතු වුවද ඊට පටහැනිව මොරගහ කන්ද හා කළුගඟ ව්‍යාපෘතීන් යටතේ ගස් 14,485 ක් ඉවත් කිරීම හා ඒ සඳහා මුදල් අයකර ගැනීමටත් අවසර දී තිබූ අතර දැඩි ස්වභාවික රක්ෂිත ප්‍රදේශයක නායගහ ව්‍යාපෘතිය යටතේ විදුලි බලාගාරයක් ඉදිකිරීමට ද අනුමැතිය ලබා දී රු. මිලියන 3 ක් පෞද්ගලික සමාගමකින් අය කරගෙන තිබුණි.

**5.6 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අයවැයගත සීමාව ඉක්මවා වැය විෂයයන් 07 ක් සඳහා රු. 43,765,791 ක මුදලක් වියදම් කර තිබුණි. තවද අරමුදලේ අයවැය ලේඛනය 2015 ජනවාරි 21 දින සංශෝධනය කර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වනසත්ව උද්‍යාන ආදායම් එකතු කිරීම
(ආ) දඩ මුදල් එක්රැස් කිරීම හා ප්‍රසාද දීමනා ගෙවීම
(ඇ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඈ) ලිපි ලේඛන පවත්වාගෙනයාම
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) තොග පාලනය